ALYONUSHKA AND HER LITTLE BROTHER IVANUSHKA

රුසියානු ජන කතාවකි

අලෝනුෂ්කා අක්කයි ඉවානුෂ්කා මල්ලියි

එකෝමත් එක රටක එකෝමත් එක කාලයක, මහලු අම්මා, තාත්තා දෙදෙනෙක් හිටියා. මේ දෙන්නට තරුණ දුවෙකුයි පුංචි පුතෙකුයි හිටියා. දුවගේ නම අලෝනුෂ්කා පුතාගේ නම ඉවානුෂ්කා.

කාලයකට පස්සේ අම්මයි තාත්තයි දෙන්නා මිය ගියා. දරුවන් දෙන්නා කාත් කවුරුවත් නැතිව තනි වුණා.

ඉතින් අලෝනුෂ්කා අක්කා, මල්ලිත් එක්ක කන්න දෙයක් සොයා ගෙන ගියා. මෙහෙම දිගටම යනකොට යනකොට ඉවානුෂ්කා මල්ලිට වතුර පිපාසයක් ඇති වුණා.

"අක්කේ! අක්කේ!! අනේ මට හරිම වතුර තිබහයි..." මල්ලි කිව්වා.

"අනේ මල්ලියේ! අපි වතුර සොයා ගෙන තව ඉස්සරහට යමු." අක්කා කිව්වා.

අක්කයි, මල්ලියි දෙන්නා වතුර සොය, සොයා තවත් ඉදිරියට ගියා. ඉරත් මුදුන් වෙලා. රස්නෙත් වැඩි වෙලා. පොළොව වේලිලා. දාඩියත් දානවා. පේනතෙක් මානෙක ළිඳක් නැහැ. ඒත් දෙන්නා දිගටම යන්න වුණා. මේ අතරමගදී හරක් කුරයකින් හැදුණු වළක වතුර පොදක් තියෙනවා මල්ලි දැක්කා.

"අක්කේ! අක්කේ!! අනේ මං අර හරක් අඩියේ තියෙන වතුර ටික බොන්නද?" කියලා මල්ලි ඇහුවා.

"එපා! එපා!!" අක්කා මල්ලිගේ අතින් ඇදලා නැවැත්තුවා. "ඔය හරක් අඩියෙ තියෙන වතුර බීව්වොත් මල්ලි වහු පැටියෙක් වේවි! එතකොට මට කෝ මල්ලියෙක්...?"

මල්ලි අක්කාගේ කීම අහලා ළිඳක් හොය හොයා තවත් ඉදිරියට යන්න වුණා.

අක්කයි මල්ලියි දෙන්නා දිගටම යනවා. ඉරත් සැරෙන් පායනවා. පොළොවත් වේළිලා. ඇඟටත් දාඩිය දානවා. තවම ළිඳක් දකින්න නැහැ.

ඒත් මේ පාර ඉවානුෂ්කා මල්ලි අශ්ව අඩියක පතුලේ තිබෙන වතුර ටිකත් දැක්කා. ඒක දැකලා මල්ලිගේ පිපාසය තවත් වැඩි වුණා.

"අක්කේ! අක්කේ!! අර පෙනෙන අශ්ව අඩියේ පතුලෙ තියෙන වතුර ටික මම බොන්නද?"

"අපොයි එපා! ඔය අශ්ව අඩියෙ තියෙන වතුර බිව්වොත් එහෙම මල්ලි අශ්ව පැටියෙක් වේවි!"

මල්ලි ඒ පාරත් අක්කාගේ අවවාදය පිළිගත්තා. දෙන්නා ඉදිරියට යන්න වුණා. ඉරත් මුදුන් වෙලා. පොළොවත් වේළිලා. දාඩියත් දානවා. මෙහෙම අක්කයි මල්ලියි වතුර හොයාගෙන යනකොට එළු අඩියකින් හැදුණ කුඩා වළක වතුර බිඳක් තියෙනවා මල්ලිට පෙනුණා.

"අක්කේ! මට දැන්නම් වතුර පිපාසය ඉවසන්න බැහැ. මම අර එළු අඩියේ තියෙන වතුර ටික බොනවා..." ඉවානුෂ්කා තරහෙන් වගේ කිව්වා.

"අනේ මල්ලියේ! ඔය එළු අඩියෙ තිබෙන වතුර බිව්වොත් ඔයා එළු පැටියෙක් වේවි! එතකොට මට කෝ මල්ලියෙක්?" අක්කා කිව්වා.

මේ පාර නම් මල්ලි අක්කාගේ කීම ඇහුවේ නැතුව, එළු අඩියේ පතුලෙ තිබුණ වතුර ටික බීගෙන බීගෙන ගියා. ඒ සැණෙන්ම මල්ලි පුංචි සුදු එළු පැටියෙක් වෙලා. අක්කා නම කියලා කතා කරන කොට සුදු එළු පැටියෙක් පැන පැන අක්කා ළඟට ආවා.

අලෝනුෂ්කා අක්කාට හරිම දුකයි. එයා ලොකු පිදුරු මිටියක් ළඟ ඇන තියාගෙන අඬන්න පටන් ගත්තා. පුංචි සුදු එළු පැටියා ඇය වටේ සතුටින් පැන පැන සිටියා.

මේ වෙලාවේ ඒ අසලින් ගිය තරුණ වෙළෙන්දෙක් අශ්වයා පිටින් බැහැලා ඇය ළඟට පැමිණියා.

"නංගියේ! ඇයි නුඹ අඬ අඬා ඉන්නෙ..." කියලා තරුණ වෙළෙන්දා ඇහුවා.

අලෝනුෂ්කා තමන්ට සිදුවූ විපත ගැන කිව්වා.

එතකොට තරුණ වෙළෙන්දා "ඔබ මගේ බිරිඳ වෙන්න කැමැති නම් මට පුළුවනි ඔබට හැම සැප සම්පතක්ම ලබා දෙන්න. සුදු එළු පැටියටත් අපිත් එක්ක ඉන්න පුළුවනි." කියලා කිව්වා.

අලෝනුෂ්කා ගොඩක් වෙලා කල්පනා කර කර ඉඳලා අන්තිමට කැමැති වුණා තරුණ වෙළෙන්දාගේ බිරිඳ වෙන්න.

ඔවුන් ඉක්මනින් විවාහ වුණා. දෙන්නා බොහොම සතුටින් කාලය ගත කළා. අක්කා කන බොන පිඟන් කෝප්පවලින් කකා බිබී සුදු එළු පැටියත් ඔවුන් සමග සිටියා.

දවසක් තරුණ වෙළෙන්දාට ගමනක් යන්න සිදුවුණා. ඒ අතරේ කොහෙද හිටපු යකින්නක් අලෝනුෂ්කාගේ ගෙදර ජනේලෙ ළඟින් මතු වෙලා හොඳට කරුණාවෙන් කතා කරලා ගඟට නාන්න යන්න කතා කළා.



අලෝනුෂ්කා කැමැති වෙලා යකින්නත් එක්ක ගඟ ළඟට ආවා. ගඟ ළඟදී යකින්න අලෝනුෂ්කාගේ ඇඟට කඩා පැනලා, එයා බිම පෙරළාගෙන එයාගේ බෙල්ලෙ ගලක් බැඳලා ගඟට තල්ලු කළා. ඊට පස්සේ යකින්න අලෝනුෂ්කාගේ ඇඳුම් ඇඳලා අලෝනුෂ්කා වගේ ගෙදර ගියා. ගෙදර කිසි කෙනෙකුට සැක හිතුණේ නැහැ. ටික වේලාවකට පස්සෙ තරුණ වෙළෙන්දාත් ගෙදර ආවා.

සුදු එළු පැටියා විතරයි දැන හිටියේ යකින්නට හැමෝම රැවටිලා කියලා. එයා හරිම දුකෙන් කන්නෙ බොන්නෙත් නැතිව හිටියා. එයා උදේ, සවස ගඟ ළඟට ගිහිල්ලා අක්කට කතා කරලා මෙහෙම කිව්වා.

"අලෝනුෂ්කා මගේ අක්කේ! මේ අහන්නකෝ
ගං පතුලෙන් පිහිනා මගේ ළඟට එන්නකෝ"

යකින්න මේක අහගෙන ඉඳලා තරුණ වෙළෙන්දාට කිව්වා සුදු එළු පැටියා මරා දමන්න කියලා.

ඒත් වෙළෙන්දා යකින්නගේ යෝජනාවට කැමැති නැහැ. සුදු එළුපැටියා ගැන ආදරයක් එයාගේ හිතේ ඇතිවෙලයි තිබුණේ. ඒත් යකින්න හැම තිස්සෙම චාටුවෙන් වද කරන කොට අවසානයේදී කැමැති වුණා.

"නුඹට කැමැති දෙයක් කර ගනිං..." තරුණ වෙළෙන්දා කිව්වා.

යකින්න ලොකු ගිනි මැලයක් ගැහුවා. ලොකු තාච්චියක් රත් කළා. පිහි මුවහත් කළා.

තමන්ට වැඩි කාලයක් ජීවත් වෙන්න ලැබෙන්නෙ නැති බව සුදු එළු පැටියට තේරුණා. එයා තරුණ වෙළෙන්දාට කතා කළා.

"ඔයා මගේ තාත්තා වගේ. මම මැරෙන්න කලින් ගඟට ගිහිල්ලා වතුර ටිකක් බීලා එන්න මට ඉඩ දෙනවද?"

තරුණ වෙළෙන්දාගෙන් අවසර ලබාගෙන සුදු එළුපැටියා ගඟ ළඟට දුවගෙන ගිහින් දුක්බර හඬින් මෙහෙම කිව්වා.

අලෝනුෂ්කා මගේ අක්කේ! මේ අහන්නකෝ
ගං පතුලෙන් පිහිනා මගේ ළඟට එන්නකෝ
ගිනි ගොඩවල් ඇවිළෙනවා
යකඩ හට්ටි රත් වෙනවා
උල් පිහි මුවහත් වෙනවා
මං මරන්න සැරසෙනවා

අලෝනුෂ්කා අක්කා මෙහෙම පිළිතුරු දුන්නා.

ඉවානුෂ්කා මගේ මල්ලී! නුඹට ඇහෙනවදෝ
පිහිනාගෙන නුඹේ ළඟට කොහොම එන්නදෝ
ගලක් බැඳලා මගෙ බෙල්ලෙ
යකින්න මා තල්ලු කළා
ගංපතුලේ වැල් පැටලී
හෙලවෙන්නට විදිහක් නෑ

යකින්න සුදු එළු පැටියා සොයන්න වුණා. ඒත් එයාට සොයා ගන්න බැරි වුණා. යකින්න සේවකයකුට කිව්වා සුදු එළුපැටියා සොයාගෙන එන්න කියලා.

සේවකයා ගඟ ළඟට ගියා. සුදු එළු පැටියා ගං ඉවුරේ එහා මෙහා දුවමින් දුක්බරව අක්කාට කතා කරනවා.

අලෝනුෂ්කා මගේ අක්කේ! මේ අහන්නකෝ
ගං පතුලෙන් පිහිනා මගේ ළඟට එන්නකෝ
ගිනි ගොඩවල් ඇවිළෙනවා
යකඩ හට්ටි රත් වෙනවා
උල් පිහි මුවහත් වෙනවා
මං මරන්න සැරසෙනවා

අලෝනුෂකා අක්කා මෙහෙම පිළිතුරු දුන්නා.

ඉවානුෂ්කා මගේ මල්ලී! නුඹට ඇහෙනවදෝ
පිහිනාගෙන නුඹේ ළඟට කොහොම එන්නදෝ
ගලක් බැඳලා මගෙ බෙල්ලෙ
යකින්න මා තල්ලු කළා
ගංපතුලේ වැල් පැටලී
හෙලවෙන්නට විදිහක් නෑ

මේක අහගෙන හිටපු සේවකයා දුවගෙන ගෙදර ගිහිල්ලා තරුණ වෙළෙන්දාට විස්තරේ කිව්වා. තරුණ වෙළෙන්දා මිනිස්සු රැස් කරලා ගඟ ළඟට ගිහින්, සේද දැලක් ගං පතුලට දාලා අලෝනුෂ්කා ගොඩට ගත්තා. බෙල්ලෙ ගැට ගහලා තිබුණ ගල ලිහලා දාලා ඇය පිරිසිදු කරලා ලස්සන ඇඳුම් ඇන්දුවා. අලෝනුෂ්කා රාජ කුමරියක් වගේ ලස්සනයි.

සුදු එළුපැටියා බොහොම සතුටට පත් වෙලා, තුන් පාරක් කරණම් ගැහුවා විතරයි එයා ආපහු පුංචි ඉවානුෂ්කා වුණා.

මිනිස්සු එකතු වෙලා කපටි යකින්න අශ්වයකුගේ වල්ගේ ගැට ගහලා එළවා දැම්මා. අශ්වයා යකින්න ඇදගෙන වේගයෙන් දුවන්න ගත්තා.

අලෝනුෂ්කා අක්කයි ඉවානුෂ්කා මල්ලියි

රුසියානු ජන කතාවකි

චිත්‍ර සැලසුම්

ටී. සෙවාර්යෝවා

රුසියානු බසින් ඉංග්‍රීසි බසට පරිවර්තනය

ඉරිනා ෂෙලෙස්නෝවා

ඉංග්‍රීසි බසින් සිංහල බසට පරිවර්තනය

සරත් කෝදාගොඩ

කුරුලු පොත් ප්‍රකාශකයෝ

594/1, නාවල පාර, රාජගිරිය දුරකථනය : 011-2863350/0718263282

Cover Design by H. Pradeep Darshana, Ragama. Tel : 0772876280

ISBN 978-955-591-289-1

මිල රු. 180/-

මුද්‍රණය : තරංජි ප්‍රින්ට්ස් - 2804773